# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT


මුදල් අමාත්‍යාංශය.
මහලේකම් කාර්යාලය, කොළඹ 01

நிதி மற்றும்
செயலகம், கொழும்பு 01

MINISTRY OF FINANCE
The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No: DMA/HRD/2019/02/Training

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2019.11.22

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
කොමිෂන් සභා ලේකම්වරුන්
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්/අභ්‍යන්තර විගණකවරුන් සඳහා විගණන සැලැස්ම පිළිබඳ පුහුණු වැඩමුළුව**

ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් / අභ්‍යන්තර විගණකවරුන් වෙනුවෙන් 2020 වර්ෂයේ විගණන සැලැස්ම සැකසීම පිළිබඳව ප්‍රායෝගික පුහුණු වැඩමුළුවක් 2019.12.13 වන දින පෙ.ව 8.30 සිට ප.ව. 4.30 දක්වා පැවැත්වීමට මෙම දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත.

02. එම වැඩමුළුව කොළඹ 01, "මිලෝදා" ආයතනයේ (පැරණි ටයිම්ස් / රේගු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල ) පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර, ඒ සඳහා ඔබ කාර්යාලයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා/ අභ්‍යන්තර විගණකවරයා සහභාගී කරවන මෙන් ඉල්ලමි.

03. තවද ආරක්ෂක හේතූන් මත එම වැඩසටහනට සහභාගී වන **නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංක ඇතුළුව නිලධාරීන්ගේ නම්** සහභාගීවීමට ප්‍රථමව මිලෝදා ආයතනය වෙත ලබා දීමට අවශ්‍ය බැවින්, ඒ සඳහා සහභාගී වන ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා/ අභ්‍යන්තර විගණකවරයා පිළිබඳ තොරතුරු dma.treasury@gmail.com යන විද්‍යුත් ලිපිනය මඟින් 2019.12.10 දිනට ප්‍රථමව දැනුම්දීමට කටයුතු කරන මෙන් ඉතා කාරුණිකව දන්වමි.

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

* www.treasury.gov.lk යන වෙබ් අඩවියේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව යටතේද මේ සම්බන්ධයෙන් තොරතුරු සඳහන් කර ඇත.


කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk